

වෙසක් තෙමතුල

බුදුහාමුදුරුවනේ.... කාරුණිකය....
දුක් වලින් පිරී ඇති....
තෙරක් නැති සසර මඟ....
මතුකෙරුණු රාග දොස් නිවීමට
ගුරුතුමෙකු ලෙසින්.....
ලස්සනට..... පැහැදිලිව.....
කරුණු පැහැදූ සේක....!
අවසරයි.... නිමියනේ....
සියළු දුක් නිමාකොට....
අරි අටහි මග නමැති
රියෙහි නැග යන්නට.....
පින්බර නිවන් පුරයට....

♦ *තමරා සරෝජනී*
සාරනාත් මහවිදුහල
කුලියාපිටිය **Sri Lanka**

ප්‍රාර්ථනා !

නන්දන කිංකිණි රාවය නංවන
මිහිරි ලොවට යන ප්‍රාර්ථනා!
පෙම්බර ජනනී රක්නට දිරි දෙන
සොඳුරු ලොවට යන ප්‍රාර්ථනා!
හෙට ලොව රැක්මට රිවි එළිදීමය
මහද ජනිතවන ප්‍රාර්ථනා!
මව්පිය දැසෙහි තුටු බිඳු නංවන
සිප් නැණ පැමය ප්‍රාර්ථනා!
තෙලිතුඩ පැමය පෙළහර පැමය
යළි මා උපතෙහි මේ රන්දීපෙහි
පෙළහර පැමය ප්‍රාර්ථනා!

♦ *ඩිලානි තරංගනී මෙන්ඩිස්*
තංගල්ල බාලිකා විදුහල
Sri Lanka

Languages භාෂාවන්

There are over 5000 languages spoken in the world, each with its own words, sounds and grammar. Some like English are spoken by millions of people all around the world. Others, like Trumai in Venezula, are spoken by less than 100. Scientists say people first learned to speak 40,000 years ago. But people could communicate by signs a long time before this. They did not learn to write until 5000 years ago.

වචන, ශබ්ද හා ව්‍යාකරණ ආදියෙන් එකිනෙකට වෙනස් භාෂාවන් 5000 කට වඩා අද ලොව පුරා කතා කෙරේ. ඒ අතුරෙන් ඉංග්‍රීසි අද ලොව පුරා කෝටි සංඛ්‍යාත ජනතාවකගේ භාෂාවයි. නමුත් වෙනිසියුලාවේ ටෘමායි නමැති බස කතා කරන්නේ සීයකටත් අඩු පිරිසකි. මිනිසා කතා කරන්නට මුලින්ම උගත්තේ දැනට වසර 40,000 කට පෙර බව විද්‍යාඥයෝ කියති. නමුත් ඔහු ලියන්නට ඉගෙනගන තව වසර 5000ක් වත් නැත.

♦ *Auntie Ramani (රමණි නැන්දා)*

මගේ වෙසක් කූඩුව

අම්මා දුන් මුදල් වලින් ගාලු ගිහිල්ලා
පාට පාට එලිය පෙට්ටි
කොළ ගෙනැවිල්ලා
හදා වෙසක් කූඩුව ගුවනේ එල්ලාලා
පත්තු කළේ මුළු මිදුලම එළිය වැටීලා
වෙසක් සිරිය ඉවරවුණා
වැස්ස ඇවිල්ලා
මගේ හිතට හරිම දුකයි කඳුළු ගලාලා



♦ *කෞෂල්‍ය රුවන්පතිරණ*
දේවපතිරාජ විදුහල
රත්ගම **Sri Lanka**

නව ඇරඹුමක්

BANK OF CEYLON (UK) LTD
BOC Gateway to Sri Lanka

BANK OF CEYLON (UK) Ltd.

ඔබගේ සියලුම බැංකුකරණ කටයුතු සඳහා

දැන් විවෘතයි...!

- ඉතිරිකිරීමේ ගිණුම්, ජංගම ගිණුම්, ස්ථාවර තැන්පතු
- පුද්ගලික ව්‍යාපාරික ණය
- ආනයන හා අපනයන සේවාවන්
- විදේශ මුදල් (යුරෝ හා ඇමරිකානු ඩොලර්) හුවමාරුව

ලංකා බැංකුවේ ශාඛාවක් ලෙස ක්‍රියාත්මක වූ අප දැන් එක්සත් රාජධානියේ, ස්වාධීන බැංකුවක් ලෙස ස්ථාපනය කර ඇති බව සතුටින් දැනුම්දෙමු.

අප මගින් ශ්‍රී ලංකාවට මුදල් යවන ඔබ සැමට ලංකාවට ගොස් නැවත පැමිණීමට ගුවන් ටිකට් පතක් දීනාගැනීමේ අවස්ථාවක්...!
2012 ජූලි තෙක් සෑම මසකටම වරක්...!
මුදල් යවන වාර ගනන වැඩිවන තරමට දීනන අවස්ථාද වැඩිවේ..!

BANK OF CEYLON (UK) LTD
BOC Gateway to Sri Lanka

1 Devonshire Square, London EC2M 4WD,
Tel: 020 7377 1888 Fax: 020 7377 5430
Email : info@bankofceylon.co.uk Web : www.bankofceylon.co.uk
Nearest Tube: Liverpool Street

(Bank of Ceylon(UK)Ltd is 100% owned by Bank of Ceylon, Sri Lanka)
Bank of Ceylon (UK) Limited is authorised and regulated by the Financial Services Authority
(FSA Referance No: 514744)
Registered in England and Wales(Company Registration No:06736473).
Registered address and Head Office: 1 Devonshire Square,London EC2M 4WD

කාගෙද මේ සුරතල් ඉබ්බා?
Somebody's pet tortoise ?

ලන්ඩනයේ විල්ස්ඩන්හි පාරක ගමන්කරනා විට ගෙයක් අසල පාර අයිනේ ගසක ගසා තිබූ දැන්වීම් කොළයක් මම දුටුවෙමි. එය කෙනෙකුට සම්බවූ ඉබ්බෙකු ගැන ය.

කාගෙදෝ සුරතලට ඇතිකරන ඉබ්බෙකු නැති වන්නට ඇත. දැන් ඉබ්බා ඉන්නේ මේ දැන්වීම්කරු ළඟ ය.

(ලංකාවේ නොසිටීම ගැන ඉබ්බා සන්තෝස විය යුතු ය. එසේ වී නම් මෙලහකට ඉබ්බාගේ අවයව ඒ රටේ කාගේ හෝ ආහාර ජීර්ණ පද්ධතිය ඇතුළේ ය.)

මේ ඉබ්බා ලස්සන බව දැන්වීම්කරු කියයි. දුටු කෙනෙකුගේ සිත් වහා ඇදගන්නට තරම් ලස්සනක් මූට ඇත. එසේ වුවද ඉබ්බාට තම අයිතිකරු සොයා යා නොහැකිය. දැන්වීම්කරු සිතන්නේ ඒ ඌට මොළේ නැති නිසා කියා ය.

කලකට පෙර බ්‍රිතාන්‍යයේ පුවත් පතක වූ ඉබ්බෙකු පිළිබඳ තවත් ප්‍රවෘත්තියක් මම කියවූවෙමි. එය නැතිවූ ඉබ්බෙකු මාස දෙකකට පසු නැවත පළමු සිටි ගෙදරට පැමිණීම ගැනය. එසේ නම් භාවා සහ ඉබ්බා රේස් ගිය කතාව බොරුවක් නොවේයයි එදා මට සිතිණ.

මේ දැන්වීම කවියකි.

Found a beautiful tortoise
Wanting to go home
Big on charm
But, small on brain

සිංහළට
නගතොත් මෙසේ

ඇත්තට
කාගෙද
මේ ඉබ්බා ?

ඉබ්බෙකි රුවින් යුත්
ගෙදර යනු ආසා ඇත්
බෙහෙවින් ගනී සිත්
එහෙත් ඒ තරමට නුවණ නැත්

♦ ***චිත්‍රා රමණි ගමගේ*** **London NW 2**

Imagine
by John Lennon



Imagine there's no heaven
It's easy if you try
No hell below us
Above us only sky
Imagine all the people
Living for today.....

Imagine there's no countries
It isn't hard to do
Nothing to kill or die for
And no religion too
Imagine all the people
Living life in peace.....

Imagine no possessions
I wonder if you can
No need for greed or hunger
A brotherhood of man
Imagine all the people
Sharing all the world.....

You may say I'm a dreamer
But I'm not the only one
I hope someday you'll join us
And the world will live as one

දිව්‍යලෝකයක් කොහිවත් නැතැයි සිතන්
අපායක් ද අපට යටින් නැත්තේ නම්
අහස පමණි ඇත්තේ අප හිසට උඩින්
අවට දකින කවුරුත් මේ මනුස්සයින්
අද පමණක් ජීවත්වන අය සෙ සිතන්

රටවල් කිසිවක් ඇත්තේ නැතැයි සිතන්
එසේ සිතන්නට අමාරු දෙයක් නොවේ
මරන්නවත් මැරෙන්නවත් දේ නැත්නම්
නැත්නම් ලොවෙහී මේ කිසිවක් ආගම්
සිතන් එසඳ ලෝ වෙසෙනා සියළු දනන්
ජීවත්වනු නිසැකයි සිත සැනසීමෙන්

බීට්ල්ස් ජෝන් ලෙනන් සහ මහගම සේකර දුටු
ලෝකය තනි යායකි

පොදි බැඳගත් දේ කිසිවක් නැතැයි සිතන්
සිටින්න හැකිවෙද සැකයකි ඒ විදියට
කෑදරකම හෝ කුසගිනි ඇවිල නො ඒ
සොහොයුරු දම පමණකි මිනිසත් භාවේ
සිතන් එවිට මිනිසුන් හැම දෙන වෙසෙනා
ලොව හැම තැන ජීවත්වන හැටි හවුලේ

හීන දකින කෙනෙකිය මා ඔබ කියාවි
එලෙස සිතන්නේ මා පමණක් ම නොවේ
සිතමි දිනක ඔබ ද එකතු වේයයි මට
තනි යායක් වේවි එවිට මුළු ලෝකෙම

1980 දෙසැම්බර් මස 8 වන දින සාහසිකයෙකුගේ වෙඩි පහරින් නිව්යෝක් හි දී මියගිය බීට්ල්ස් සංගීත කණ්ඩායමේ ජෝන් ලෙනන් 1971දී පබඳා ගැයූ ඉමැජින් (සිතන්න) නම් ඉංග්‍රීසි ගීයේ අරුත සමීප සිංහල කවි බසින් ඉහත ලියා දැක්වූයෙමි. ලෙනන්ගේ ගීත අතුරින් ඉමැජින් මගේ ප්‍රියතම ගීයයි. එසේම එදා මෙන් අදත් ලොවපුරා සුවහසක් සංගීත ලෝලයෝ ඒ ගීතය අතිශයින් ප්‍රිය කරති.

මහගම සේකර වියත් කවියාණන්ද සිය අකල් මරණයට ආසන්න කාලයේ නිබැඳි අවසාන කාව්‍ය සංග්‍රහය, **ප්‍රබුද්ධ** නම් වේ. එහි මෙසේ ලියැවී ඇත.

වෙසක් පහන් වලින් ගලන
සවණක් ගන රැසින් වැසී
පොළොව බෙදූ තාප්ප හා
කටු කම්බිද
මොහොතින්
අතුරුදහන් වී ගොසින් ය
ලෝකය තනි යායකි.

අහස පෙළොව හා ගහ කොළ
මුළු ලෝකය අප හැම සතු
පොදු දේපළක් බවට
මොහොතක් පත් වී ඇත.
සුබො බුද්ධානං උප්පාදෝ

සේකර හා ලෙනන් යන කවියන් දෙදෙනම එක් හා සමාන අදහසක් දක්වන බව මට පසක් වූයේ මේ මෑතක දී ය. එනම් මුළු ලොව බෙදීම් නැති එක යායක් වන්නේ නම් කොපමණ යහපත් ද යන්න ය. මතු කලක එය එසේ ම වේවායි පතමි!

♦ ***දයා ආනන්ද***

Srilanka Information Sites ශ්‍රී ලංකා තොරතුරු අඩවි
www.srilankans.com www.srilankatours.co.uk www.srilanka-holidays.co.uk